# රියැදුරු - තනතුරු 01

## පුරප්පාඩු පිරවීම

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ රියැදුරු III ශ්‍රේණිය තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02)ක් සහිතව විෂයයන් හයකින් (06) සමත්වී තිබිය යුතුය.**

**ශිල්පීය ප්‍රවීණතා**

i. **මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.**

**වයස් සීමාව**

**අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.**

**වෙනත් සුදුසුකම්**

**සෑම අපේක්ෂකයෙක්ම ,**

I. **ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.**
II. **තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.**
III. **විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.**

**වැටුප් පරිමාණය :**

**PL - 3 (III ශ්‍රේණිය)**

**රු: (43,280 - 10×490 - 10×540 - 10×590- 12×630 – 67,040)**

**රු: 43,280 /- ක මූලික වැටුප් පියවරෙහි තබන අතර,**

**රජය විසින් අනුමත අනිකුත් සියලුම දීමනා ද හිමි වේ.**

**පොදු කොන්දේසි**

අපේක්ෂකයන් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයක් මගිනි. මෙම තනතුරු ස්ථිර වන අතර වසර 03ක පරිවාස කාළයකට යටත් වේ.

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සිය අයදුම්පත පහත සඳහන් ලිපිනයට **2025. 06. 13 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලේඛන වල ඡායා පිටපත්ද සමඟ පාලන භාරකාර , ලෝහෝර් ආර්යා ණය අරමුදල, අංක 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02. යන ලිපිනයට එවිය යුතුය.** තවද මෙම සහතික පත්වල මුල්පටපත් සම්මුඛ පරීක්ෂණයේදී අනිවර්යෙන් ඉදිරිපත් කල යුතුය.

I. උප්පැන්න සහතික පිටපත
II. අධ්‍යාපන සහතික වල පිටපත්
III. පළපුරුද්ද පිළිබඳ සහතික වල පිටපත්
IV. වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත්
V. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක පිටපත්
VI. අදාල සහතික පිටපත් අමුණා නොමැති අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**පාලන භාරකාර,**
**ලොහෝර් ආර්යා ණය අරමුදල,**
**අංක: 100 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,**
**කොළඹ - 02.**